# මනස, ද්‍රව්‍යය හා විකිරණය

අපේ ඉතිහාසයේ ස්වර්ණමය යුගය වුයේ පැරණි අනුරාධපුර යුගය බවට අමුතුවෙන් සාක්ෂි අවශ්‍ය නො වෙයි. මෙරට තිබු ඉපැරණි සංස්කෘතිය හා මිහිඳු හිමියන් විසින් නිල වශයෙන් ගෙනන ලද ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය මුසුවීමෙන් නිර්මාණය කෙරුණු සිංහල බෞද්ධ සංස්කෘතිය පස්වැනි සියවස පමණ වන තෙක් ම අළුත් දැනුම එකතුකෙළේ ය. එහෙත් ඉන්පසුව අපට දක්නට ඇත්තේ වර්ධනයවීමට මැලිකමක් දැක්වූ සංස්කෘතියකි. මුල්කාලයේ දී ලෝකයේ ථෙරවාදී මධ්‍යස්ථාන තිබී ඇත්තේ දෙකකැයි ද, ඒ මධ්‍යස්ථාන ලංකාවේ හා ආන්ද්‍ර ප්‍රදේශයේ විණි යැයි ද කිවහැකි ය. එහෙත් කලින් සඳහන්කරන ලද ආකාරයට බුදුදහම භාරතයේ බ්‍රාහ්මණයන්ගේ ප්‍රහාරයට හසුවී ආරක්ෂණවාදී ප්‍රතිපත්තියක් අනුගමනයකෙරී මෙරට මහාවිහාරයෙන් නිර්මාණකරණය අතපසු වූ බවක් පෙනෙන්නට ඇත. එහෙත් අභයගිරියට ඒ ප්‍රශ්නය ඒ ආකාරයෙන් බලපෑ ආකාරයක් පෙනේනට නැත. අභයගිරිය ඉන්පසුව ද යම් යම් නිර්මාණ කළ බවත් ඒ නිර්මාණ බොහෝවිට දැනුමට වඩා කලාශිල්ප වැනි වෙනත් ක්ෂෙත්‍රවලට සීමාවූ බවත් පෙනී යයි.

අභයගිරියේ ක්‍රියාකලාපය කෙසේ වුව ද මහාවිහාරය නිර්මාණකරණයෙන් බැහැරවීම විශාල පාඩුවක් විය. හත්වැනි අටවැනි සියවස්වලට පසුව ද, සුළු නිර්මාණ දැකිය හැකි වුව ද, පෙර මෙන් වැදගත් ස්වදේශීය නිර්මාණ කිසිම ක්ෂෙත්‍රයක දක්නට නො ලැබෙයි. ඉන්පසුව බොහෝවිට නිර්මාණ කෙරී ඇත්තේ භාරතයේ දැනුම මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට අවශෝෂණය කිරීමේ දී ය. ගද්‍ය පද්‍ය ආදී සාහිත්‍ය නිර්මාණයේ දී මේ බව අපට පෙනී යයි. අවශෝෂණය ද යම් ආකාරයක නිර්මාණයක් නමුදු ඒ හුදු දේශීය නිර්මාණයක් තරමට වැදගත් වේ යැයි නො කිවහැකි ය. සාහිත්‍යයෙහි දී එවැනි හෝ නිර්මාණ දැකිය හැකි වුව ද, ශාස්ත්‍රීය දැනුම සම්බන්ධයෙන් එවැනි දෙයක් හෝ සිදු වී නො මැත.

එයට හේතුව ආරක්ෂණවාදී ප්‍රතිපත්තිය යැයි කිවහැකි ය. මහාවිහාරයේ භික්ෂූන්වහන්සේ ට බුදුදහම ආරක්ෂාකිරීම ජීවිතයෙහි වැදගත් ම කාර්යය විය. ආන්ද්‍ර ප්‍රදේශයෙන් ථෙරවාදය නැතිවීමෙන් පසුව ලංකාව ථෙරවාද බුදු දහමෙහි ප්‍රධාන ආරක්ෂකයා බවට පත්විය. ඇතැම්විට මහාවිහාරික භික්ෂූන් වහන්සේ එසේ ආරක්ෂණවාදී ප්‍රතිපත්තියක් අනුගමනයකිරීමේ ප්‍රතිඵලය ලෙස පසුකලක දී බුදු සසුන නැතිව යන තත්ත්වයකට පත්වන්නට ඇත. පහරදීම හොඳම ආරක්ෂණවාදී ප්‍රතිපත්තිය වේය යන්න අමතක නොකෙළේ නම් ඇතැම්විට ලංකාවෙන් බුදුදහම බැහැරවීමේ තර්ජනයකට ඉතිහාසයේ කිසි දිනෙක මුහුන නොපෑමට ඉඩ තිබුණි.

කෙසේ වෙතත් මේ ආරක්ෂණවාදී ප්‍රතිපත්තිය අනුගමනයකිරීමේ ප්‍රතිලයක් ලෙස අවස්ථා කිහිපයක ම ලංකාවෙන් බුදුදහම නැතිවීමේ තර්ජනය විය. අද වුව ද අපට අපේ නිර්මාණ සම්බන්ධයෙන් කිවහැක්කේ එවැනි කරුණකි. මේ හේතුවෙන් මෙරට සංස්කෘතියට හිමිතැන අහිමි කිරීම සඳහා විවිධ ආකාරයේ සංවිධානාත්මක ආයතන විසින් ප්‍රබල ව්‍යාපාර ගෙනයනු ලැබී ඇත. දැනුදු ඒ සිදුවෙයි. අරක්ෂණවාදී ප්‍රතිපත්තිය කෙටිකාලීනව යහපත් විය හැකි නමුදු දීර්ඝකාලීනව ගත්කල ඉන් යහපතකට වඩා අයහපතක් වන බව පැහැදිලිය.

ආරක්ෂණවාදී ප්‍රතිපත්තිය හේතුකොටගෙන අටුවා ටීකා ආදිය බුද්ධවචනය මෙන් සැලකෙන තත්ත්වයක් උදාවිය. අප අද උත්සාහකරන්නේ අපේ ප්‍රවාද නිර්මාණයකිරීමට ය. එහි දී අපි සිංහල බෞද්ධ චින්තනය මත පදනම් වෙමු. එමෙන් ම අටුවා, ටීකා ආදිය සිංහල බෞද්ධ චින්තනය මත පදනම් ව නිර්මානය කෙරුණු දැනුම් ලෙස සලකමින් අපේ ප්‍රවාද නිර්මාණයේ දී ඒ ගුරුකොට ද ගනිමු. එහෙත් ඒ දැනුම බුද්ධභාෂිතයක් ලෙස නො සලකමු. අවශ්‍ය නම් ඒ දැනුම සංශෝධනයකිරීමට හෝ ප්‍රතික්ෂෙපකිරීමට හෝ අපි පසුබට නො වෙමු.

ආරක්ෂණවාදී ප්‍රතිපත්තියෙන් සිදු වී ඇත්තේ අපේ දැනුමක් වර්ධනය නො වීම ය. ආරක්ෂණවාදී ප්‍රතිපත්තියකින් තොරව සිංහල බෞද්ධ සංස්කෘතිය නගාසිටුවීමට ද හැකි ය. අනෙක් අතට අද අප අපේ ප්‍රවාද, විශේෂයෙන් ම වියුක්ත ප්‍රවාද ගොඩනොනැගුවහොත් අපට වැඩිකලක් සිංහල බෞද්ධ සංස්කෘතිය රැකගැනීමට ද නොහැකිවනු ඇත. සිංහල බෞද්ධ සංස්කෘතිය රැකගැනීම යනු ඒ වෙනස් නොකිරීම නො වෙයි. වෙනස් නොවන සංස්කෘතියක් රැකගැනීමට නො හැකි ය.

© Prof. Nalin De Silva

අද අපට ප්‍රවාද නිර්මාණයකිරීමේ දී මුහුණදීමට ඇති එක් ගැටළුවක් නම් අපට අවශ්‍ය සියල්ල පැරණි පොතපතෙහි ඇතැයි යනුවෙන් කෙරෙන උපකල්පනය ය. උදාහරණ ලෙස ගතහොත් බෞද්ධ ආර්ථිකය (ආර්ථික විද්‍යාව) හෝ බෞද්ධ දේශපාලනය (දේශපාලන විද්‍යාව) හෝ සූත්‍ර දේශනාවල ඇතැයි ඇතැම්හු සිතති. මේ පුද්ගලයන් වියුක්ත ප්‍රවාදයක් යනු කුමක් ද යන්න තබා ප්‍රවාදයක් යනු කුමක් දැයි නොදන්නා බව පැහැදිලි ය. සූත්‍ර දේශනාවල හෝ අටුවා, ටීකා ආදී පැරණි පොතපතෙහි හෝ එලෙස ආර්ථික විද්‍යාවක් හෝ දේශපාලන විද්‍යාවක් හෝ නැත. ආර්ථිකය හෝ දේශපාලනය හෝ පිළිබඳ කරුණක් දෙකක් එහි සඳහන්වන බව ඇත්ත ය. එහෙත් ඒ ප්‍රවාද නො වෙයි. උදාහරණයක් වශයෙන් ගතහොත් සිගාලෝවාද සූත්‍රයෙහි පුද්ගලයකු වියදම්කළයුතු ආකාරය හා ඉතිරිකළයුතු ආකාරය පිළිබඳ සඳහන්වෙයි. ඒ දැනුම ආර්ථික ප්‍රවාදයක් නො වෙයි. ඒ දැනුම මත හිඳිමින් අපට ආර්ථිකයක් ගොඩනගාගත නො හැකි ය.

මනස සම්බන්ධයෙන් ප්‍රවාදයක් ගොඩනැඟීමට අපි උත්සාහකරන්නෙමු. ඒ දැනුම සමහරවිට අප සාමාන්‍යයෙන් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි පිළිගෙන ඇති දැනුමට වඩා වෙනස්විය හැකි ය. එය අපට ප්‍රශ්නයක් නො වෙයි. අප උත්සාහකරන්නේ අපේ චින්තනය කුමක්දැයි හඳුනාගෙන ඒ මත පදනම් වී නව දැනුමක් ගොඩනගාගැනීම ය. දැනුම නිර්මානයකිරමේ දී අප සැලකිලිමත් විය යුත්තේ අපේ චින්තනය පිළිබඳ ව ය. (චින්තනය වුව ද වෙනස් නොවන්නේ යැයි මෙයින් ගම්‍ය නො වෙයි.)

අද මෙරට බොහෝ දෙනා මනෝකාය නම් සංකල්පයක් ගැන කතාකරති. පුද්ගලයකු සතු මනෝකාය ඒ පුද්ගලයාගේ මරණින් පසු භෞතික සිරුර අත්හැර යන බව ඇතැම්හු කියති. ඇතැමුන්ට අනුව පුද්ගලයකු ජීවත් ව සිටිය දී ද මනෝකායට සිරුරෙන් පිටවී යෑමේ හැකියාවක් ඇත. ඇතැම් රෝගීන්ට ශල්‍යකර්ම කෙරෙන අවස්ථාවල මනෝකාය සිරුරෙන් ඉවත් වී අහසෙහි සිට ශල්‍යකර්මය කරනු බලා සිටි අවස්ථා ගැන ද සඳහන් වෙයි. ශල්‍යකර්මයෙන් පසු මනෝකාය නැවතත් භෞතික සිරුරට ඇතුල්වී ඇති බව ද  සඳහන් වෙයි. අඩුතරමින් එසේ ඇතුල්වීමක් උපකල්පනය කෙරෙයි.

ඇතැමුන්ට  අනුව පුද්ගලයකුගේ මනෝකාය ඒ පුද්ගලයාගේ භෞතික සිරුරේ ස්වරූපය ම ගනියි.  එය එසේ විය හැකි ය. එහෙත් පැහැදිලිව ම ඒ එසේ නම් ඒ මනෝකාය ඒ පුද්ගලයා (සත්ත්වයා) වෙනත් භවයක භෞතික ශරීරයක් ඇතිව උපත ලබන තෙක් පමණක් විය යුතු ය. එසේ වෙනත් භවයක උපත ලැබීමෙන් පසුව වෙනත් භෞතික ශරීරයක් ලැබෙන්නේ නම් එවිට යට කී අදහස අනුව මනෝකාය ඒ අළුත් භෞතික ශරීරයේ ස්වරූපය ගතයුතු ය. එහෙත් මනෝකාය පිළිබඳ මෙවැනි අදහස්වලින් පමණක් අපට සෑහීමකට පත්විය නො හැකි ය. මනෝකාය නිර්මාණය වී ඇත්තේ කිනම් ද්‍රව්‍යවලින් ද? අනෙක් අතට අළුත් භවයේ භෞතික ශරීරයක් නොලබන සත්ත්වයකුට ඇත්තේ මනෝකාය පමණක් ද? ඒ මනෝකායේ ස්වරූපය පෙර භවයේ භෞතික ශරීරයේ ස්වරූපය තවදුරටත් ගන්නේ ද? මේ ප්‍රශ්න හා තවත් එවැනි ප්‍රශ්න සමබන්ධයෙන් සංගත පිළිතුරු ලබාදීමට අපට හැකිවිය යුතු ය. එසේ නැතහොත් ඒ දැනුමට පිළිගැනීමක් නො ලැබෙයි.

එහෙත් එයටත් වඩා වැදගත් ප්‍රශ්න වෙයි. මනෝකාය හා මනස අතර ඇති සම්බන්ධය කුමක් ද? මනස යනු මනෝකාය ම ද? එසේ නම් අපට අමුතුවෙන් මනෝකාය යනුවෙන් සංකල්පයක් අවශ්‍ය වන්නේ ඇයි? මනෝකාය යම් ද්‍රව්‍යයකින් හෝ ද්‍රව්‍යවලින් නිර්මාණය වී ඇත්නම් මනස නිර්මාණය වී ඇත්තේ කිනම් ද්‍රව්‍යයකින් ද? ඒ ප්‍රශ්නය එසේ ඇසීම නිවැරදි ද?  මනස ද්‍රව්‍යයකින් නිර්මාණය විය හැකි ද? නාම රූප පච්චයා විඤ්ඤාණ, විඤ්ඤාණ පච්චයා නාම රූප යනුවෙන් පටිච්ච සමුප්පාදය විස්තරකිරීමේ දී ඇතැම් තැනෙක සඳහන්වන දැයින් කියැවෙන්නේ කුමක් ද?

මනස යමකින් නිර්මාණය වී ඇතැයි කියන්නන් තරම් ද්‍රව්‍යවාදීන් (භෞතිකවාදීන්) සිටිය හැකි යැයි මම නො සිතමි. මනස යමකින් (එනම් ද්‍රව්‍යයකින්) නිර්මාණය වී ඇතැයි කියන්නෝ මූලික වශයෙන් ගත්කල සියල්ල ද්‍රව්‍යයට ඌනනය කළහැකි යැයි සිතන ඌනිතවාදීහු වෙති. තම සිතැඟි අනුව සිත මිස කය නැති බඹලොවක් ගැන කියැවෙන්නේ කෙසේ දැයි තේරුම්කළ නොහැකි වූ විට මේ ද්‍රව්‍යවාදී ඌනිතවාදීහු එවැනි බඹලොවක කය ඉතා සියුම් ආකාරයක් ගන්නේ යැයි කියති. මේ සියුම්බව කෙතරම් සියුම් දැයි ඔවුහු විස්තර නො කරති.

© Prof. Nalin De Silva

මේ ඌනිතවාදීහු බුදුදහමවත් බටහිර විද්‍යාවවත් හරිහැටි දන්නෝ නො වෙති. අපි පළමුව බටහිර විද්‍යාවෙහි ද්‍රව්‍යය පිළිබඳ ව කියැවෙන්නේ කුමක්දැයි සලකා බලමු. බටහිර විද්‍යාවෙහි ද්‍රව්‍යය (matter) හා විකිරණ (radiation) යනුවෙන් කොටස් දෙකක් වෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ ඒ වර්ග එකිනෙකින් ස්වායත්ත ව පවතින බව නො වෙයි. ද්‍රව්‍යය විකිරණ බවට ද විකිරණ ද්‍රව්‍යය බවට ද පත්කළ හැකි ය. නො එසේ නම් පත්වෙයි. ද්‍රව්‍යය මෙන් ම විකිරණය ද අවසාන වශයෙන් ගත්කල ශක්තිය වෙයි. ඝන, ද්‍රව වායු ප්ලස්මාවල පමණක් නොව විකිරණයෙහි ද ශක්තිය වෙයි.

අයින්ස්ටයින් විද්වතාගේ $E = mc^2$ සමීකරණයෙන් ද්‍රව්‍යයෙහි ඇති ශක්තියක් ගැන කියැවෙයි. මෙහි E යනු ශක්තිය ද m යනු ස්කන්ධය ද වෙයි.

සාමාන්‍ය තාරකාවල මේ ක්‍රියාවලිය නිරන්තරයෙන් සිදුවෙයි. එහි ද්‍රව්‍යයවල ස්වරූපය න්‍යෂ්ටික ප්‍රතික්‍රියා ඔස්සේ වෙනස් වෙයි. උදාහරණයක් ලෙස ඇතැම් තාරකාවක හයිඩ්‍රජන් පරමාණු එකතු වී (දැවී) හීලියම් පරමාණු නිර්මාණය වනවා විය හැකි ය. හයිඩ්‍රජන් පරමාණු එසේ දැවී හීලියම් බවට පත්වීමේ දී එහි අංශුවල ස්කන්ධය අඩුවෙයි. ඒ හයිඩ්‍රජන් පරමාණුවල හා දැවීමෙන් නිර්මිත වූ හීලියම් පරමාණුවල ස්කන්ධ අතර වෙනස ඉහත සඳහන් සමීකරණය අනුව ශක්තිය බවට පත්වෙයි. ඒ ශක්තිය විකිරණය බවට පත්වෙයි. වෙනත් වචනවලින් කියන්නේ නම් ද්‍රව්‍යය විකිරණය බවට පත්වෙයි. අනෙක් අතට පරමාණුවකට විකිරණය අවශෝෂණය කළ හැකි ය. එසේ අවශෝෂණය කෙරෙන විකිරණය පරමාණුවේ ඉලෙක්ට්‍රෝනයකට එක කක්ෂිකාවක (orbital) සිට වෙනත් කක්ෂිකාවකට පැනීමට ඉවහල්වනු ඇත. එවැනි ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස පරමාණුවේ ස්කන්ධය ද සුළු වශයෙන් හෝ වැඩිවන බව ද අමතක නොකළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva